# ශ්‍රී ලංකාවේ ජනවාර්ගික අර්බුදය සහ පුවත්පත් මාධ්‍යයෙහි ක්‍රියාකාරීත්වය

සරසි ඡායා බණ්ඩාර[19]

## සංක්ෂේපය

ජනවාර්ගික ඝට්ටනයන් පවත්නා ව්‍යාකුල සමාජයක සමකාලීන ජන විඥානයෙහි විවිධ වූ මනෝ චිත්‍රණයන් ගොඩනැංවීමෙහි ලා ජනමාධ්‍ය දක්වනු ලබන ප්‍රබල දායකත්වය අතිශය සුවිශේෂී වේ. දශක තුනකට අධික කාලයක ඉතිහාසයකට උරුමකම් කියන මෙරට ප්‍රධානතම ව්‍යවසනය වන ජනවාර්ගික ගැටලුව උත්සන්න වීම කෙරෙහි ජනමාධ්‍ය දැනුවත් ව හෝ නොදැනුවත් ව ඍජු බලපෑමක් සිදු කොට ඇත. 1970 දශකය අග භාගය වන විට පොදු ජනතාවට වඩාත් සමීප හා පොදු ජනතාවට වැඩි වශයෙන් බලපෑම් කොට ආමන්ත්‍රණය කළ හැකි එක ම ජනමාධ්‍ය පුවත්පත් මාධ්‍ය (Newspapers Media) බවට පත්විය. මෙරට සිංහල, දමිළ ජනවාර්ගික අර්බුදයෙහි අතිශය තීරණාත්මක සන්ධිස්ථානයක් ලෙස සැලකෙන 1983 ජූලි 23 වන දින හමුදා නිලධාරීන් 13ක් කුරිරු ත්‍රස්තවාදී ඉලක්කයන්ගේ ගොදුරක් බවට පත් වීමේ සිද්ධිය හඳුනා ගත හැකි ය. එකී සිද්ධිය සම්බන්ධ ව මෙරට පුවත්පත් මාධ්‍ය වාර්තාකරණය වූ කලී සිංහල, දමිළ වාර්ගික දුරස්ථභාවයට මග පෙන්වීමකි. 1983 ජූලි 23 වන දින හමුදා භටයන් 13 දෙනෙකු ඝාතනය වීමේ සිද්ධිය සම්බන්ධ ව පුවත්පත් මාධ්‍ය වාර්තාකරණය කෙබඳු ද? යන්න හඳුනා ගැනීමත්, රජයේ හා පෞද්ගලික පුවත්පත් මාධ්‍ය ආයතන මගින් වෘත්තීය ආචාර ධර්ම හා මාධ්‍ය මූලධර්ම මත පිහිටා ස්වකීය මාධ්‍ය භාවිතාව ඉටු කරනු ලබන්නේ ද? යන්න විමර්ශනය කිරීම මෙමගින් අපේක්ෂිත ය. ප්‍රාථමික දත්ත හා ද්විතියික දත්ත මූලාශ්‍ර කොට ගෙන සිද්ධි අධ්‍යයන ක්‍රමවේදය යටතේ 1983 ජූලි මස තෝරා ගත් පුවත්පත් කිහිපයක් ඇසුරින් දත්ත විමර්ශනාත්මක ව ඉදිරිපත් කොට ඇත. වාර්ගික සුහදතාව හා අන්‍යෝන්‍ය විශ්වාසය (Friendliness & Confidence between Nations) වර්ධනය වන අන්දමින් ජන විඥානය මෙහෙය වීමට පුවත්පත් කලාවේදීන් කටයුතු නොකළ බව ප්‍රත්‍යක්ෂ වනු නිසැක ය.

**මුඛ්‍ය පද:** *ජනවාර්ගික ඝට්ටනය, පුවත්පත් මාධ්‍ය, වාර්තාකරණය, ජනමාධ්‍ය, ආචාර ධර්ම.*

## හැඳින්වීම

පශ්චාත් දෙවන ලෝක යුද සමයෙහි ගොඩනැගුණු නව ජාතික රාජ්‍යයන් බහු ආගමික වූ ද, බහු වාර්ගික වූ ද බහුත්ව සමාජ බවට විපරිවර්තිත විය. එකී බහුත්ව සමාජ තුළ ජාතිකත්වය පිළිබඳ හැඟීම තහවුරු නොවීමෙන් ජනවාර්ගිකත්වය මත පදනම් වූ ගැටුම් ක්‍රමික ව විකාශනය විය. මානව ශිෂ්ටාචාරයේ ආරම්භයේ සිට ම ස්වාභාවික වූ නිරන්තර සිදුවීමක් ලෙස සැලකෙන ගැටුම් ඇතිවීමට හේතු වන ව්‍යුහාත්මක සාධකයක් ලෙස "ජනවාර්ගික සාධකය" ඉතා වැදගත් වේ. නූතන යුගයෙහි සමජාතීය හෙවත් සජාතීය සමාජයන් සහිත රාජ්‍යයන්ට සාපේක්ෂව බහු වාර්ගික, බහු ආගමික ප්‍රභේදයන් සහිත බහුත්ව සමාජ සහිත රාජ්‍යයන් හි බහුල වශයෙන් විවිධාකාර වූ අභ්‍යන්තර ගැටුම් දක්නට ලැබේ. එකී බහුත්ව සමාජයන් හි වාර්ගික කණ්ඩායම් අතර ගොඩ නැගෙන තෘප්තිමත් නොවූ අභිමතාර්ථ හෙවත් ඉච්ඡාභංගත්වයට පත් වූ අභිමතාර්ථ සහ නොඑකඟතාවයන් බොහෝදුරට අවසන් වන්නේ, මානව හා භෞතික විනාශයන් ද සහිත ප්‍රචණ්ඩ ගැටුමකිනි.

සුළු ජන කණ්ඩායම් ප්‍රජාතන්ත්‍රීය ව කරනු ලබන ඇතැම් ඉල්ලීම් ලබා නොදීම මත ප්‍රජාතන්ත්‍රවාදී නොවන ගැටුම්කාරී ස්වරූපයෙන් එකී ඉල්ලීම් දිනා ගැනීමට පෙළඹේ. රාජ්‍යයන් විසින්

[19] ශාස්ත්‍රවේදී දේශපාලන විද්‍යා (විශේෂ) තෙවන වසර

ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාමාර්ගයන්ගෙන් බැහැර වූ භීෂණය, ප්‍රචණ්ඩත්වය වැනි ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියා මාර්ග කෙරෙහි අවතීර්ණ වන අවස්ථාවන්හි දී රාජ්‍ය අභ්‍යන්තර ගැටුම් උත්සන්න වේ. "යම් රටක පවතින ජාතික මතවාදයන් හි ස්වභාවය ද ගැටුම් ඇති වීමට තුඩු දිය හැකිය. ඇතැම් රටවල ජාතිකවාදය හා පුරවැසිභාවය නිශ්චිත ජනවාර්ගිකත්වයක් මත රඳා පවතී. එබඳු තත්ත්වයක් බොහෝ විට උද්ගත වනුයේ ආයතනික දුර්වලතා ඇති විටදී ය. මෙම තත්ත්වය ඉතා පැහැදිලි ලෙසට බෝල්කන් රටවලින් පැරණි සෝවියට් දේශයට අයත් වූ රටවලින්, සංවර්ධනය වෙමින් පවත්නා රටවල් වෙතින් දක්නට ලැබේ (සමරනායක, 1997: 11)".

සිංහල හා දෙමළ ජනවාර්ගික අනන්‍යතාව මත ධ්‍රැවීකරණය වූ මෙරට සිවිල් අර්බුදය මතවාදීමය ජනවාර්ගික ගැටුමක් බවට පරිවර්තනය වූයේ 20 වන සියවස මැද භාගයේ දීය. මෙරට ජනවාර්ගික අර්බුදය 1980 දශකයේ සිට ආයුධ සන්නද්ධ, ප්‍රචණ්ඩ ගැටුමක් බවට පරිවර්තනය විය. 1983 ජූලි 23 වන දින ද්‍රවිඩ සන්නද්ධ අරගලයේ නියමුවන් විසින් හමුදා සෙබළු 13 දෙනෙකු ඝාතනය කිරීම වූ කලී මෙරට දශක තුනක් පුරා පැවති සිවිල් යුද්ධයෙහි අතිශය තීරණාත්මක සංධිස්ථානයක් ලෙස හඳුනා ගත හැකිය. මෙකී ඝාතනයන් සමග උතුරේ මතු වූ තත්ත්වයන් ඊට සාපේක්ෂව දකුණේ ඇති වූ දමිළ විරෝධයත් සමග මුළු රට ම ප්‍රචණ්ඩකාරී තත්ත්වයක් බවට පත් කළේ ය. ලෝක දේශපාලන, ආර්ථික හා සමාජයීය තත්ත්වයන්ගෙන් වියුක්තව ස්වාධීන ප්‍රපංචයක් ලෙස ජනමාධ්‍ය හඳුනා ගැනීම අපහසු ය. එනම්, ජනමාධ්‍ය හා සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික ක්ෂේත්‍රයන් අතර පවතින්නේ, අවියෝජනීය සබඳතාවයකි. සමස්ත සමාජය යම් මතයක් කරා යොමු කරමින් මතවාදීමය කාර්යභාරයක් ඉටු කරනු ලබයි. යම් රටක සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික ප්‍රගමනය හෝ පරිහානියට ජනමාධ්‍ය විසින් එල්ල කරනු ලබන බලපෑම ප්‍රබල වන්නේ එහෙයිනි. තම වාර්ගික ජන කණ්ඩායම වෙත පමණක් සංකේන්ද්‍රණය වූ පටු සීමාවන් හා පටු මතවාද අභිබවා සමාජ බහුවිධත්වය මැනවින් නිරූපණය වන පරිදි පෘථුලව සිය මාධ්‍ය වගකීම ක්‍රියාත්මක කළ යුතුය. සමාජයේ එක් ජන වර්ගයකට පමණක් පක්ෂග්‍රාහී වූ හෝ යම් ජන වර්ගයක් කෙරෙහි අගතීන් (RacialPrejudice) නිර්මාණය කිරීමට තුඩු දෙන කරුණු ඉදිරිපත් නොකිරීමට ජනමාධ්‍ය වග බලා ගත යුතු ය.

"ත්‍රස්තවාදය ත්‍රස්තවාදයෙන් ම විනාශ කළ යුතු ය යන්න වර්තමානයේ දී බෙහෝ දෙනෙකු පිළිගන්නා මතයකි. කවුරුන් කෙසේ පැවසුව ද එය කිසිවිටෙකත් තිරසාර විසඳුමක් නොවේ (රණසිංහ, 1998: 259). ශ්‍රී ලංකාවේ ජනවාර්ගික අර්බුදය මාධ්‍යවේදීන් ඇති කළ අර්බුදයක් නොවුව ද, එකී අර්බුදය දශක තුනක් පුරාවට ලේ වැගිරෙන ප්‍රචණ්ඩ අර්බුදයක් බවට පත් කිරීමේ යම් වගකීමක් පුවත්පත් කලාවේදීන් සතු වේ. "දැඩි වගකීමකින් යුතුව ක්‍රියා කරන මාධ්‍ය සංස්කෘතියක් අපේ රටේ තිබුණේ වී නම් 1983 ජූලි සිද්ධීන් මේ රටේ ඇති නොවන්නට ඉඩ තිබුණේ යැයි සිතමි (අයිවන්, 1998: 255)". අතිශය තීරණාත්මක අවස්ථාවන් ලෙස සැලකෙන 1983 ජූලි 23 වන දින හමුදා භටයින් 13 දෙනෙකු ඝාතනය කිරීමසම්බන්ධ ව පුවත්පත් මාධ්‍ය වාර්තාකරණය කෙබඳු ද? යන්න හඳුනා ගැනීම මෙම අධ්‍යයනයෙන් අපේක්ෂිත ය.

## ජනමාධ්‍ය ආචාර ධර්ම

ජනමාධ්‍ය භාවිතයෙහි උචිත රාමුව සකසනු වස් "ජනමාධ්‍ය ආචාර ධර්ම" හඳුන්වා දෙනු ලැබිණි. වගකීමෙන් තොර වූ, අවිචාරශීලී ජනමාධ්‍ය භාවිතය හේතුවෙන් ඇති වන සමාජ ව්‍යාකූලතාවය දුරු කරනු අරබයා "ජනමාධ්‍ය ආචාර ධර්ම" කෙරෙහි අවධානය යොමු කරන ලදී. 2000 දෙසැම්බර් 21 වන දින කොළඹ දී පැවැති ජනවාර්ගික ප්‍රවෘත්ති කලාවේදී වැඩමුළුවේ දී "ජනවාර්ගික ප්‍රවෘත්ති කලාව සඳහා ජනමාධ්‍යවේදීන්ගේ වගකීම් සහ මාර්ගෝපදේශ පිළිබඳ මාධ්‍ය ආචාර ධර්ම සංග්‍රහය" ඉදිරිපත් කර ඇත. එනම්, ජනමාධ්‍යවේදීන්, සාමය ප්‍රවෘත්තිමය වටිනාකමකින් යුතු අංගයක් ලෙස සැලකීම, ජනවාර්ගික ප්‍රවෘත්ති වාර්තාකරණයේ දී එයට සම්බන්ධ සියලු පාර්ශව සමඟ සාකච්ඡා පවත්වන විට ඔවුන්ගේ අදහස් හා මතවාදයන්ට ඉඩ දීම, ජනමාධ්‍යවේදීන් සාම ක්‍රියාදාමයන් සම්බන්ධ ව සමාජීය ප්‍රශ්න පිළිබඳව ද අධ්‍යයන, පර්යේෂණ සහ සසඳා බැලීම් කිරීම සඳහා උත්සහ කිරීම, ජනවාර්ගික ප්‍රවෘත්ති වාර්තාකරණයේ දී විෂය මූලික, නිරවද්‍යතාව, අදාළ සෑම පාර්ශවයක් ම ආවරණය කිරීම සහ සාමය රැකීමට පාදක වන අයුරින් වාර්තා කිරීම, ජනවාර්ගික ප්‍රවෘත්ති

වාර්තාකරණයේ දී පූර්ව අපේක්ෂිත නිගමන සාධාරණීකරණය සඳහා පවත්වන සම්මුඛ සාකච්ඡාවලින් වැළකීම, ජනවාර්ගික සිද්ධි වාර්තාකරණයේ දී හැකි සෑම අවස්ථාවක දී ම අදාළ ස්ථානයට ගොස්, ස්ථානගත වාර්තාකරණයේ නිරත වීමට උත්සහ කිරීම, ජනමාධ්‍යවේදීන් ජනවාර්ගික සාමය ඇති කිරීම සඳහා විවිධ ජන සංවිධාන සමඟ සබඳතා වැඩි දියුණු කිරීම, ජනවාර්ගික හා ආගමික ජන කොටස්වල සිත් නොපෑරෙන අන්දමට වාර්තා කළ යුතු අතර ජාතිකත්වය හෝ ආගමික අනන්‍යතාවය හෝ වාර්තා කළ යුත්තේ මහජන සුබ සිද්ධියට සෘජුව ම බලපාන්නේ නම් පමණි, සියලු ජනවගයන්ගේ සංස්කෘතීන් පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීම, එයට ගරු කිරීම සහ ජනතාවට ඒ පිළිබඳ ව අවබෝධයක් ලබා දීම (වික්‍රමරත්න, 2001: 185) වේ.

ජනමාධ්‍යවේදීන් සිදු නොකළ යුතු ක්‍රියා පිළිබඳව ද දැක්වේ. එනම්, අපහාස සිදු නොකළ යුතු ය,වෙනත් තැනක පළ වූ වාර්තාවක් ඒ අයුරින් ම නැවත වාර්තා නොකළ යුතු ය, (නිරුක්තිය) ද්වේෂයෙන් කටයුතු නොකළ යුතු ය, දූෂණ ක්‍රියාවන්ට සම්බන්ධ නොවිය යුතු ය. ජනමාධ්‍යවේදීන් සිදු කළ යුතු ක්‍රියා පිළිබඳව ද දැක්වේ. එනම්, නිරවද්‍යතාවයෙන් යුතු ව වාර්තා කළ යුතු ය, නිවැරදි තොරතුරු/නිවැරදි විස්තර වාර්තාකරණයට පෙර සාක්ෂි හා නිවැරදි කරුණු එකතු කළ යුතු ය, අපක්ෂපාතීත්වය/සමබරතාව හා වගකීම වේ. ජනවාර්ගික සට්ටනයන් පවත්නා සමාජයක ජනමාධ්‍යයෙහි භූමිකාව අතිශයින් ම වැදගත් වන අතර සමාජ ප්‍රගතිය ඇති කිරීමට හෝ සමාජ පරිහානිය සිදු කිරීමට ජනමාධ්‍ය විසින් කරනු ලබන බලපෑම සහ ක්‍රියාකාරීත්වය ඉතා වැදගත් වන අතර ජනමාධ්‍ය ආචාර ධර්ම මාලාවන් පැවතීම තුළින් වගකීම් සහගත, විශ්වාසනීයත්වයෙන් යුතු මාධ්‍ය භාවිතාවක් ගොඩනැගෙනු නිසැක ය.

## ජනවාර්ගික අර්බුදය සම්බන්ධ ව පුවත්පත් මාධ්‍යයෙ හි ක්‍රියාකාරීත්වය

දශක තුනක ඉතිහාසයකට උරුමකම් කියන මෙරට සිංහල, දමිළ ජනවාර්ගික සට්ටනයෙහි අතිශය තීරණාත්මක සන්ධිස්ථානයක් ලෙස සැලකෙන 1983 ජූලි 23 දින කුරිරු ත්‍රස්තවාදී ඉලක්කයන්ගේ ගොදුරු බවට හමුදා භටයන් 13 දෙනෙකු ඝාතනය වීමේ සිද්ධිය හඳුන්වා දිය හැකිය. 1983 ජූලි මස රෝපණය වූ ව්‍යාකුල සමාජමය කැළඹීම හේතුවෙන් සිංහල, දමිළ ජනවාර්ගික දුරස්ථභාවය ක්‍රමික ව වර්ධනය විය. අන්‍යෝන්‍ය ජනවාර්ගික සුහදතාව ගොඩ නගනු පිණිස ජනවාර්ගික පුවත්පත් මාධ්‍ය වාර්තාකරණය සතු භූමිකාව අතිශය සුවිශේෂී වේ. එකී කාර්යභාරය වගකීම් සහගත ව 1980 දශකය මුල් භාගයෙ හි ඉටු වුණි නම්, දශක තුනක් පුරා දිවෙන වාර්ගික අරගලයක් සිදු නොවන්නට තිබුණි. මෙම අවදියෙහි ජනවාර්ගික ප්‍රවෘත්ති වාර්තාකරණයක තිබිය යුතු සමාජ වගකීම පිළිබඳ අවධානය යොමු කිරීම ඉතා අවම මට්ටමක පැවති බව හඳුනා ගත හැකිය.

### 1983 ජූලි 23 දින හමුදා නිලධාරීන් 13 දෙනාගේ ඝාතනය සම්බන්ධව 1983 ජූලි 25 දින පුවත්පත් වාර්තා කිරීමේ ස්වරූපය පිළිබඳ අන්තර්ගත විශ්ලේෂණය

#### ලංකාදීප පුවත්පත

**ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් යුද සෙබළු 13 ක් එතැනමයි (ප්‍රධාන සිරස්තලය - ලංකාදීප පුවත්පත- 1983 ජූලි 25)**

ලංකාදීප පුවත්පත ද, කුරිරු කොටි සංවිධානයේ ගොදුරක් බවට ශ්‍රී ලංකා යුද සෙබළුන් 13 දෙනෙකු ඝාතනයට ලක් වීමේ සිද්ධිය වාර්තාකරණයේ දී පුළුල් ඉඩක් වෙන් කොට ඇති බව 1983 ජූලි 25 දින ප්‍රකාශයට පත් කරන ලද ලංකාදීප පුවත්පතෙහි ප්‍රධාන සිරස්තලය විශ්ලේෂණයෙන් හඳුනා ගත හැකි වේ. ලංකාදීප පුවත්පත විසින් එම සිද්ධිය වාර්තා කරනුයේ, ඒ සිද්ධිය හා තවත් සිද්ධියක් ප්‍රධාන සිරස්තලය ලෙස යොදා ගනිමිනි. එනම්, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යංශය විසින් නිකුත් කරන ලද නිවේදනය ද උපුටා දක්වමිනි."යුද සෙබළු 13 ක් එතැනමයි" යනුවෙන් සඳහන් කිරීම තුළ යුද සෙබළු 13 දෙනාම ඒ ප්‍රහාරය සිදු වූ මොහොතේ ම මිය ගොස් ඇති බව පැහැදිලි

වේ.ත්‍රස්තවාදීන් කෙරෙහි අනිසි බියක්, වෛරයක් ඇති වන අතර සාමාන්‍ය ද්‍රවිඩ වැසියන් පිළිබඳව ද එවන් වෛරීය සිතුවිලි ජනනය වනු ඇත.

**දවස පුවත්පත**

**යාපනයේ දී හමුදා රථ දෙකකට ත්‍රස්තවාදී ප්‍රහාර, බෝම්බ ගසා වෙඩි තබා හමුදාවේ 13 ක් මරා දමති. අවමඟුල් කටයුතු පූර්ණ හමුදා ගෞරව ආචාර සහිතව (ප්‍රධාන සිරස්තලය - දවස පුවත්පත - 1983 ජූලි 25)**

අතිශයෝක්තියක් දනවන ආකාරයේ වදන් භාවිතා කරන ස්වරූපයක් හඳුනා ගත හැකි වේ. " බෝම්බ ගසා", "වෙඩි තබා" යනුවෙන් වදන් භාවිතා කිරීම තුළ හමුදා භටයන් 13 දෙනාගේ මළ සිරුරුවත් හඳුනා ගත නොහැකි මට්ටමකට පත් ව ඇතැයි යන සිතුවිලි පාඨකයා තුළ ජනනය වනු ඇත. සිදු වූ සිද්ධිය වඩාත් බැරෑරුම් කරමින් ඉදිරිපත් කිරීම තුළ සිංහල ජන කැළඹීමකට සෘජුව ම හේතුවක් වන බව පැහැදිලි වේ. ජනමාධ්‍ය ආචාර ධර්මයන් සලකා බලන කල මෙවන් ආකාරයෙන් කරුණු ඉදිරිපත් කිරීම උචිත නොවේ.අන්‍යොන්‍ය වාර්ගික භේදය උත්සන්න වීම හේතු කොට ගෙන මෙම කාල සීමාවෙ හි රටේ විවිධ ප්‍රදේශයන් හි සිංහල, දමිළ ජනවාර්ගික සට්ටනයක් ඉස්මතු වීමෙහි ලා ජනමාධ්‍ය අතරින් පුවත්පත් මාධ්‍යය ද යම් බලපෑමක් සිදු කරන්නට ඇති බව විචාරක මතය වේ.

**දිවයින පුවත්පත**

**ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් හමුදාවේ 13 ක් මරුට (ප්‍රධාන සිරස්තලය - දිවයින පුවත්පත - 1983 ජූලි 25)**

"කෝප්‍රල් ආර්.ඒ.එම්. පෙරේරා, ලාන්ස් කෝප්‍රල් අයි.එච්. සුමතිපාල යන දෙදෙනා බරපතල තුවාල ලබා යාපනය රෝහලට ඇතුලත් කර ඇත" යනුවෙන් ආරම්භයේ දී සිරස්තල යටතේ අදාළ සිදුවීම විස්තර කරමින් ඇතුළත් කොට ඇත. ප්‍රවෘත්ති පත්‍ර දෙපාර්තමේන්තු නිවේදනය ද සම්පූර්ණයෙන් ම ඇතුළත් කොට ඇති අතර, මෙම පිපිරීමෙන් ජීප් රියේ සිටි දෙදෙනෙක් එතැන දී මරුමුවට පත් වූහ'' යනුවෙන් දිවයින පුවත්පත විසින් ප්‍රධාන සිරස්තලය යටතේ සඳහන් කරමින් අදාළ සිදුවීම තහවුරු කරයි. 'දිවයින' පුවත්පත ඉදිරිපත් කරන ලද මෙම ප්‍රධාන සිරස්තලය මධ්‍යස්ථ මතධාරියෙකුගේ දෘෂ්ටි කෝණයෙන් ඉදිරිපත් කොට ඇති බව පැහැදිලිය. ප්‍රධාන සිරස්තලය කියවන අයෙකුට ක්ෂණිකව අවේගශීලි හැඟීම් දැඩිව ඉස්මතුනොවන අන්දමින්, මහා ජන කැළඹීමක් ඇති නොවන ආකාරයෙන් කරුණු ඉදිරිපත් කිරීමට පෙළඹී ඇති ආකාරය මෙම සිරස්තල තුළින් දැක ගත හැකිය.

**දිනමිණ පුවත්පත**

**හමුදාවේ 15 ක් ප්‍රහාරයෙන් නසිති (උප සිරස්තලය - දිනමිණ පුවත්පත - 1983 ජූලි 25)**

රාජ්‍ය මාධ්‍යයක් ලෙස සැලකෙන 'දිනමිණ' පුවත්පත මෙම සිදුවීම කෙරෙහි ලබා දී ඇත්තේ අඩු ප්‍රමුඛත්වයක් බව පැහැදිලි වේ. මෙම සිදුවීම ජනවාර්ගික ගැටළුව සම්බන්ධ ව ඇති වූ ප්‍රථම මහා පරිමාණ හමුදා නිළධාරීන් රැසක් ඝාතනයට ලක් වීමේ සිදුවීම ලෙස හඳුනා ගත හැකිය. දිනමිණ පුවත්පත මෙම සිදුවීම "උප සිරස්තලයක්" ලෙස වාර්තා කිරීමට පෙළඹීම උචිත නොවේ. කෙසේ වුවද, දිනමිණ පුවත්පත විසින් "හමුදාවේ 15 ක් ප්‍රහාරයෙන් නසිති" යනුවෙන් සඳහන් වුව ද සත්‍ය වශයෙන් ම හමුදා භට සෙබළු 13 දෙනෙකු ජීවිතක්ෂයට පත් වූ බව පැහැදිලිය. එහෙත්, මෙහි දක්වා ඇත්තේ "15 ක් නසිති" යනුවෙනි. දිනමිණ පුවත්පත විසින් උප සිරස්තලයක් ලෙස මුල් පිටුවේ සඳහන් කළ ද එහි විස්තර ඇතුළු පිටුවක සඳහන් කිරීම ද අනුචිත වේ.

**1983 ජූලි 23 දින හමුදා නිලධාරීන් 13 දෙනාගේ ඝාතනය සම්බන්ධ ව 1983 ජූලි 25 දින පුවත්පත් වාර්තාකරණය පිළිබඳ සංසන්දනාත්මක දත්ත විශ්ලේෂණය**


වගු අංක 1.1 හා ප්‍රස්ථාර අංක 1.1 මගින් නිරූපණය වන පරිදි, ජනවාර්ගික අර්බුදය සම්බන්ධ විසඳුම් කරා යා යුතු ප්‍රවේශය ලෙස බොහෝ පුවත්පත් මාධ්‍ය සඳහන් කරනුයේ ත්‍රස්තවාදීන්ගේ කෲරතර, ම්ලේච්ඡ ක්‍රියා මර්දනය කිරීම උදෙසා ශ්‍රී ලංකා රජය පියවර ගත යුත්තේ, සාමකාමී සාකච්ඡා, සටන් විරාමයෙන් නොව යුදමය ප්‍රවේශයකින් බවයි. ත්‍රස්තවාදීන් එල්ල කරනු ලබන ම්ලේච්ඡ ප්‍රහාරයන්ට ප්‍රතිප්‍රහාර එල්ල කරමින් ත්‍රස්තවාදී මර්දනය කිරීමට ශ්‍රී ලංකා රජය පියවර ගත යුතු බවට මතයක් බොහෝ පුවත්පත් මාධ්‍ය සමාජය වෙත ඒත්තු ගැන්වීමට උත්සහ දරා ඇති බව පැහැදිලි ය. 'දිවයින' පුවත්පත සාමකාමී ප්‍රවේශය ඉස්මතු කිරීමට උත්සහ ගත්ත ද, එදින ප්‍රකාශයට පත් ලංකාදීප, දවස, දිනමිණ පුවත්පත් තුන යුදමය ප්‍රවේශය ඉස්මතු කිරීමට උත්සහ දරා ඇත. ලංකාදීප, දවස, දිනමිණ පුවත්පත් තුනට සාපේක්ෂ ව මෙම වාර්තාරකණය සම්බන්ධ ව දිවයින පුවත්පත විසින් පුවත්පතකින් ඉටු විය යුතු මාධ්‍ය මෙහෙවර නිසි පරිදි ඉටු කිරීමට උත්සහ දරා ඇති බව පැහැදිලි ය.

වගු අංක 1 ඃ හමුදා භටයන් 13 දෙනෙකු ඝාතනය වීමේ සිද්ධිය සම්බන්ධ ව පුවත්පත් විසින් ජනවාර්ගික අර්බුදය විසඳිය යුත්තේ කුමන ප්‍රවේශයකින්ද? යන්න විග්‍රහ කිරීම පිළිබඳ දත්ත.

| ප්‍රකාශිත දිනය | පුවත්පතේ නම | ජනවාර්ගික අර්බුදය විසඳීමේ ප්‍රවේශය | |
|---|---|---|---|
| | | සාමකාමී ප්‍රවේශය සනාථ කළ වාර්තා | යුදමය ප්‍රවේශය සනාථ කළ වාර්තා |
| 1983/07/25 | ලංකාදීප | - | 01 |
| 1983/07/25 | දවස | - | 01 |
| 1983/07/25 | දිවයින | 01 | - |
| 1983/07/25 | දිනමිණ | - | 01 |
| | එකතුව | 01 | 03 |

මූලාශ්‍රඃ ක්ෂේත්‍ර සමීක්ෂණය, 2016

ප්‍රස්තාර අංක 1: හමුදා භටයන් 13 දෙනෙක් ඝාතනය වීමේ සිද්ධිය සම්බන්ධව පුවත්පත් විසින් ජනවාර්ගික අර්බුදය විසඳිය යුත්තේ කුමන ප්‍රවේශයකින් ද? යන්න විග්‍රහ කිරීම පිළිබඳ ප්‍රස්ථාරය




මූලාශ්‍ර: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2016


වගු අංක 2: මුදා භටයන් 13 දෙනෙකු ඝාතනය වීම සම්බන්ධ ව පුවත්පත් විසින් වාර්තාකරණයට යොදා ගත් ඉදිරිපත් කිරීමේ ශෛලිය පිළිබඳ විශ්ලේෂණය

| ප්‍රකාශිත දිනය | පුවත්පතේ නම | යොදා ගත් ඉදිරිපත් කිරීමේ ශෛලිය | |
|---|---|---|---|
| | | විෂය මූලික ශෛලිය | ආඛ්‍යානගත ශෛලිය |
| 1983/07/23 | ලංකාදීප | - | 01 |
| 1983/07/23 | දවස | - | 01 |
| 1983/07/23 | දිවයින | 01 | - |
| 1983/07/23 | දිනමිණ | - | 01 |
| | එකතුව | 01 | 03 |

මූලාශ්‍ර: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2016

වගු අංක .2 විශ්ලේෂණය කිරීමේ දී නිරූපණය වන්නේ ජනමාධ්‍ය ආචාර ධර්මයන් විසින් අපේක්ෂා කරන ලද මධ්‍යස්ථභාවයෙන් බැහැර ව මෙකල බොහෝ පුවත්පත් විසින් ජනවාර්ගික අර්බුදය විග්‍රහ කිරීමට ඉදිරිපත් වී ඇති ආකාරයයි. දිවයින පුවත්පත පමණක් ආඛ්‍යානගත ශෛලිය හෙවත් ආවේගශීලී ව ඉදිරිපත් කිරීමේ ශෛලියෙන් බැහැර ව විෂය මූලික ශෛලිය හෙවත් සාමාන්‍ය ඉදිරිපත් කිරීමේ ශෛලිය වෙත යොමු වීම විශේෂ ලක්ෂණයකි. එහෙත්, ලංකාදීප, දිනමිණ සහ දවස පුවත්පත් ආඛ්‍යානගත ශෛලිය කරා යොමු වී ඇත. ඒ තුළින් පාඨකයා තුළ ජනවාර්ගික අර්බුදය සම්බන්ධ ව දෘෂ්ටිවාදය ගොඩනැගෙනන්නේ, ආවේගශීලී අන්දමේ පටු දෘෂ්ටියකි.

ප්‍රස්තාර අංක 2: හමුදා භටයන් 13 දෙනෙකු ඝාතනය වීම සම්බන්ධව පුවත්පත් විසින් වාර්තාකරණයට යොදා ගත් ඉදිරිපත් කිරීමේ ශෛලිය පිළිබඳ විශ්ලේෂණය ප්‍රස්ථාර ඇසුරින් නිරූපණය





මූලාශ්‍ර: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2016

වගු අංක 3: හමුදා නිලධාරීන් 13 දෙනෙකු ඝාතනය වීම සම්බන්ධව පුවත්පත් විසින් වාර්තාකරණයේ දී ජනමාධ්‍ය ආචාර ධර්ම සුරක්ෂිත කිරීම / නොකිරීම පිළිබඳ විශ්ලේෂණය

| ප්‍රකාශිත දිනය | පුවත්පතේ නම | හමුදා භටයන් 13 දෙනෙකු ඝාතනය වීම | |
|---|---|---|---|
| | | ජනමාධ්‍ය ආචාර ධර්ම සුරක්ෂිත කරමින් වාර්තාකරණය | ජනමාධ්‍ය ආචාර ධර්ම සුරක්ෂිත නොකරමින් වාර්තාකරණය |
| 1983/07/25 | ලංකාදීප | - | 01 |
| 1983/07/25 | දවස | - | 01 |
| 1983/07/25 | දිවයින | 01 | - |
| 1983/07/25 | දිනමිණ | - | 01 |
| | එකතුව | 01 | 03 |

මූලාශ්‍ර: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2016

ප්‍රස්තාර අංක 3: හමුදා නිලධාරීන් 13 දෙනෙකු ඝාතනය වීම සම්බන්ධව පුවත්පත් විසින් වාර්තාකරණයේ දී ජනමාධ්‍ය ආචාර ධර්ම සුරක්ෂිත කිරීම/නොකිරීම පිළිබඳ විශ්ලේෂණය




මූලාශ්‍ර: ක්ෂේත්‍ර සමීක්ෂණය: 2016

වගු අංක 3 හා ප්‍රස්ථාර අංක .3 මගින් මැනවින් නිරූපණය වන පරිදි පැහැදිලි වන්නේ, 1980 දශකය මුල් භාගයේ පැවති බොහෝ පුවත්පත් මාධ්‍යයන් ජනවාර්ගික ප්‍රවෘත්ති වාර්තාකරණයේ දී බොහෝ දුරට ජනමාධ්‍ය ආචාර ධර්ම මාලාව පසෙකලා ස්වකීය අභිමතය පරිදි කටයුතු කර ඇති බවකි. ජනමාධ්‍ය ආචාර ධර්ම මාලාව සුරක්ෂිත වන අන්දමින් ස්වකීය වාර්තාකරණයෙ හි නියැලීමට උත්සහ දරා ඇත්තේ, දිවයින පුවත්පත පමණි. ලංකාදීප, දවස, දිනමිණ පුවත්පත් 'දිවයින' සමග සසඳා බලන කල ජනමාධ්‍ය ආචාර ධර්මයන්ට පටහැනි වීම කැපී පෙනෙන දුර්වලතාවයකි. 'දිවයින' පුවත්පත මධ්‍යස්ථව, විවේචනාත්මකව, සමාජය තුළ පටු ආකල්ප මෙන් ම වාර්ගික අවිශ්වාසය, වෛරය ගොඩ නොනැගෙන අන්දමින් සමබර ව, දැඩි ආවේගශීලී හා ජන කැළඹීම් ඇති වීමට හේතු නොවන අන්දමින් වාර්තාකරණය කිරීමට වග බලා ගැනීම වැදගත් වේ.

## නිගමනය

මෙරට සිවිල් අර්බුදය නිරාකරණයෙහි ලා සාර්ථක දේශපාලන කතිකාවක් ගොඩ නැංවීමට පුවත්පත් කලාවේදීන් අපොහොසත් වූ බව මෙම ලිපියෙන් හෙළිදරව් වේ. "දැඩි වගකීමෙන් යුතු ව ක්‍රියා කරන මාධ්‍ය සංස්කෘතියක් අපේ රටේ තිබුණේ වී නම් 1983 ජූලි සිද්ධීන් මේ රටේ ඇති නොවන්නට ඉඩ තිබුණේ යැයි සිතමි. අතිවිශාල විනාශයක් ඇතිකිරීමට හේතු වන උද්වේගකර සමාජ මානසික පරිසරයක් ඇති කර තිබුණේ ජනමාධ්‍ය විසිනි (අයිවන්, 1998: 255)". බහුත්ව සමාජ තත්ත්වය අවබෝධ කොට නොගත් බොහෝ පුවත්පත් කලාවේදීන් සිංහල ජනතාව "සිංහල" ජනවර්ගය ලෙස ද, දමිළ ජනතාව "දමිළ" ජනවර්ගය ලෙස ද හුදෙකලා කොට වාර්ගික දුරස්ථභාවය ගොඩ නැංවීමට ප්‍රබල බලපෑමක් ජනවාර්ගික පුවත්පත් වාර්තාකරණය හරහා සිදු කොට ඇති බව මෙමගින් ඉස්මතු වන කරුණකි. "කැඩී බිඳී වෙන්වීමට දඟලන දේශය යාකළ හැක්කේත්, ජාතිභේදවාදයෙන් අන්ධ වී, වෛරයෙන් මුසපත් වී, බලකාමයෙන් හා ධනකාමයෙන් දූෂණය වූ ජනතා සිත් සතන් වෛරයෙන් හා ක්‍රෝධයෙන් මුදා ගත හැක්කේත්, අපක්ෂපාතී, අවංක චේතනාවෙන් යුතු මානව හිතවාදී පුවත්පත් කලාවේදීන් ඇතුළු මාධ්‍යවේදීන්ට පමණි (රණසිංහ, 1998: 260)".

බොහෝ පුවත්පත් මාධ්‍යයන් ජනමාධ්‍ය ආචාර ධර්ම පසෙක ලා, වගකීම් විරහිත අන්දමින්, අන්‍ය ජනවර්ගය කෙරෙහි ආවේගශීලී හැඟීම් ඉස්මතු කෙරෙන හුදෙක් ආඛ්‍යානගත සම්ප්‍රදායකින්

වාර්තාකරණයට පෙළඹී ඇති බව මෙම ලිපියෙන් පසක් වේ. ලංකාදීප, දවස, දිනමිණ ඒ සඳහා නිදසුන් වේ. එහෙත්, සමාජමය දෘෂ්ටිය ගොඩ නැංවීමට පුවත්පත් මාධ්‍ය ඍජු දායකත්වයක් දක්වන බැවින් දැඩි වගකීම් සහගත අන්දමින් පුවත් වාර්තාකරණයට පෙළඹිය යුතු ය. "හැම හොඳ පුවත්පත් කලාවේදියෙකුගේ ම යුතුකම වනුයේ තමන් දකින සැබෑ සමාජ තත්ත්වය හා සැබෑ සිද්ධීන් ස්වකීය පාඨකයන් හමුවේ සත්‍යවාදී ලෙස ඉදිරිපත් කිරීම ය. ප්‍රවෘත්ති කෙරෙහි දක්වන අවංකභාවය, හැම පුවත්පත් කලාවේදියෙකුගෙන් ම බලාපොරොත්තු වන මූලික කාර්යභාරය වේ. පුවත්පත් කලාවේදියා තමා දකින ලෝකය ඉදිරියේ කැඩපතක් අල්ලා ගෙන සිටින තැනැත්තෙකු වැන්න (අබේසිංහ, 1998: 271)". පුවත්පත් කලාවේදීන් භාෂාමය, ආගමික විෂමතාව ඉවත් කොට යුදමය වාතාවරණය පිළිබඳ බුද්ධිමය ආමන්ත්‍රණයක නියැලේ නම්, වාර්ගික සහෝදරත්වය හා සාමය උදා වන්නේ ය.

## ආශ්‍රිත ග්‍රන්ථ


අතුකෝරල, පී., 2006. *ශ්‍රී ලංකාවේ වාර්ගික ගැටලුව, ප්‍රභවය හා වර්ධනය*, නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

අයිවන්, වී., 2006. *අර්බුදයේ අන්දරය*, මහරගම: රාවය ප්‍රකාශකයෝ, .

අයිවන්, වී., 2008. *කඳුළු සලන පාරාදීසය*, මහරගම: රාවය ප්‍රකාශකයෝ.

අයිවන්, වී., 1999. *නිදහස ජාතික ඒකාග්‍රතාව හා දේශපාලනයේ පවුල් පොරය*, රත්මලාන: නන්දන මාරසිංහ අනුස්මරණ ග්‍රන්ථ ප්‍රකාශක පදනම.

අයිවන්, වී., 1998. *ශ්‍රී ලංකාවේ ජනමාධ්‍යවේදියා සහ වාර්ගික අර්බුදය (මත දැක්මක්)*, කොළඹ : ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ ප්‍රකාශනයකි.

උයන්ගොඩ, ජේ., 2008. *ගැටුම්, සිවිල් යුද්ධ හා සාමය ගොඩ නැගීම*, කොළඹ : සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

කාරියවසම්, ටී., 1998. *ආචාර ධර්ම හා ජනසන්නිවේදනය*, කොළඹ : ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ ප්‍රකාශනයකි.

දම්මුල්ල, එම්., 1998. *ජනමාධ්‍ය ආචාර ධර්ම*, කොළඹ : ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ ප්‍රකාශනයකි.

රණසිංහ, එස්., 1998. *ජනවාර්ගික ගැටලුව සහ පුවත්පත් කලාවේදියා*, කොළඹ : ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ ප්‍රකාශනයකි.

Banks, M., 1955. *Ethnicity: Antropological Constructions*, London: Rontledge.

Dissanayake, T. D. S. A., 1983. *The Agony of Sri Lanka: in deptu account of the racial riots of 1983*, Colombo: Swasthika Publication.

Galtung, J., 2000. *The Task of Peace Journalism, Ethnical Perspectives*, Germany: University of Hardecke.

Kalansooriya, R., 2001. *LTTE & IRA* , Colombo: Sanhinda Publishers.

Mendis, L. M. H., 2004. *Assignment Peace in the Name of the Motherland*, Volume III, Colombo: Ranco Print Publication.

Smith, A. D., 1971. *Theories of Nationalism*, London: Gerald Duckworth & Company LTD.